**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව - 2023**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීමේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හර හා බැර රු.5,076,258 ක් ලෙස අනුමත කළ ජර්නල් සටහන් ලෙජරයට හර රු.4,301,258 ක් හා බැර රු.430,258 ක් ලෙස පිටපත් කර තිබුණි. | මෙය සිදු වූ අතපසු වීමකි. ජ'නල් සටහන නිවැරදි කරන ලද බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | රු. 4,293,630 ක ජ'නල් සටහනකට අනුමැතියක් නොතිබුණි. | අතපසු වීමකි. නිවැරදි කරන ලද බව | - එම - |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.10,520,274ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, ආයුර්වේද ඖෂධ හා ලී බඩු උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | 2023 වර්ෂයේ ලද 2020,2021 හා 2022 වර්ෂවලට අදාළ රු.7,170,728ක පළාත් පාලන ආධාර ණයගැති ලැබීම්, සමුච්චිත අරමුදල් අතිරික්තතා හා ඌනතා ගිණුමට හරකර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | 2020 වර්ෂයේ විගණන ගාස්තු ගෙවා ඇතත්, ඒ සඳහා රු.200,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එමෙන්ම, 2023 වර්ෂයට විගණන ගාස්තු වෙන්කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | 2022 වර්ෂයට අදාළ රු.365,010 ක වියදමක් 2023 වර්ෂයේ ගෙවීම නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඉ) | ගිණුම් විෂයයන් 12 ක පැවති රු.2,267,244ක ශේෂ, අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | ප්‍රතිපත්ති හා තීරණ ගැනිමේ කමිටු තීරණයට අනුව සිදුකළ බව | විධිමත් අනුමැතියක් මත කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | විධිමත් අනුමැතියකින් තොරව ගිණුම් විෂයයන් 02ක රු.4,130,000 ක ආරම්භක ශේෂ නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් යොදා තිබුණි. | පිළිගනිමි. | - එම - |

### 1.6.3 නොසැසඳුණු පාලන ගිණුම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයන් 03කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව හා උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.11,563,234 ක වෙනසක් පැවතුණි. | 2024 වර්ෂයේ දී නිවැරදි කරමි. | ශේෂ නිවැරදි කර ගත යුතු වේ |
| (ආ) | ගිණුම් ශේෂ 07ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එම ශේෂ අතර රු.921,918 ක වෙනසක් පැවතුණි. | වෙනස සොයා නිවැරදි කරන බව. | - එම - |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1)වගන්තිය | වර්ෂ 2001 - 2015 අතර කාලය තුළ ටෙන්ඩර් කළ මස්, මාළු කඩ හා පොදු වැසිකිලිවලින් හිඟහිටි රු.201,809ක් වගකිව යුතු නිලධාරීන්ගේ අය කරන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා තිබුණද, එසේ අයකර නොතිබුණි. | අවශ්‍ය කටයුතු මේවන විට සිදුකරමින් පවතින අතර වර්ෂ අවසානයේ දී යම් ප්‍රමාණයකින් හෝ නිම කිරීමට කටයුතු කරන බව | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------------------- | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිම 10ක් අදාළ කාර්යය නිම වීමෙන් පසු පියවීමට ප්‍රමාද වූ කාලය දින 07 ත් මාස 04 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇතිබව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |
| | (ii) මුදල් රෙගුලාසි 571(3) | වසර 02 ඉක්මවූ රු.643,548 ක තැන්පතු නිරවුල්කර නොතිබුණු අතර පොදු වෙළඳපොළ පෙර ගෙවුම් මුදල් (Key money) රු.3,539,450 ක් ආදායමට නොගෙන වර්ෂ 02 ත් වර්ෂ 10 ත් අතර කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | වර්ෂ 02 ඉක්මවන ලද තැන්පතු නිදහස් කිරීමට කටයුතු කරමින් පවතින බව | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,108,248 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,203,932 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| වරිපනම් හා බදු | 8,377,360 | 8,375,042 | 5,198,885 | 2,758,399 | 5,990,289 | 8,467,619 | 9,165,795 | 4,586,367 |
| කුලී | 30,164,250 | 22,826,395 | 21,541,467 | 2,812,726 | 18,738,663 | 21,300,685 | 24,054,670 | 6,847,788 |
| බලපත්‍ර ගාස්තු | 775,050 | 775,050 | 809,925 | - | 695,050 | 691,225 | 633,000 | - |
| වෙනත් ආදායම් | 17,140,000 | 17,140,000 | 19,422,422 | 2,773,554 | 3,219,578 | 13,788,054 | 8,877,358 | 8,979,131 |
| | **56,456,660** | **49,116,487** | **46,972,699** | **8,344,678** | **28,643,580** | **44,247,583** | **42,730,823** | **20,413,286** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම්, අක්කර බදු. කුලී හා වෙනත් ආදායම්වලින් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු. 13,259,833ක් වූ අතර එම ශේෂය තුළ වසර 05ට වැඩි රු. 5.338,925 ක ශේෂ පැවැතිණි. | හිගහිටි අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සහ සැලසුම් සකස් කර ඇති බව | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |
| (ආ) | 2018 හා 2022 වර්ෂවලට අදාළව කඩ කාමර 05 කින් රු.592,440 ක් අයකර නොතිබිණි. | කඩ කාමර 03ක් හිඟ මුදල් ගෙවා ඇත. ඉතිරි කඩ කාමර සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | - එම - |
| (ඇ) | 2021,2022 හා 2023 වර්ෂ තුළ හිඟහිටි දැන්වීම් පුවරු ආදායම රු.234,200 ක් විය. හිඟ දැන්වීම් පුවරු ගාස්තු වාර්ෂිකව ඉදිරියට ගෙනැවිත් නොතිබීම නිසා හිඟ මුදල නිවැරදිව හඳුනාගත නොහැකි වී තිබුණි. | මේ වන විට නිවැරදි කර ඇති බව | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ලද පැමිණිලි 44ක් පසුවිපරම් කර නොතිබුණු අතර එම ඉදිකිරීම්වලට එරෙහිව නඩු පැවරීමට ද කටයුතු කර නොතිබුණි. | පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බවත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ දී ගැටළු මතු නොවූ බැවින් නඩු පැවරීම් සිදු නොකළ බව. | අනවසර ඉදි කිරීම් සම්බන්ධ නීතිරීති අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි අදාළ අනුමැතිය රහිතව වීථි පහන් 1459 ස්ථාපිත කර තිබුණු අතර ඒ කිසිවක් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ටෙන්ඩර් කැඳවා තිබුණ ද, මස් කඩ 03 ක්, ඉඩම් කොටසක් හා පොදු වැසිකිළියක් 2023 වර්ෂය තුළ බදු දීමට නොහැකි වීම නිසා රු.2,121,140 ක ආදායමක් අහිමි වී තිබුණි. | විවිධ අඩුපාඩු නිසා ටෙන්ඩර් ක්‍රියාත්මක නොවුණු බව | ආදායම් නොපමාව රැස් කළ යුතු වීම. |
| (ඈ) | බදු දුන් දේපළවලින් කාලීනව කුලී අයකර නොගැනීම නිසා පැවරූ නඩු වෙනුවෙන් රු.1,590,906ක් ගෙවීමට සිදු වී තිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අලාභ නොපමාව පියවාගත යුතු වීම. |
| (ඉ) | කඩ කාමර 36 ක් සඳහා 2023 වර්ෂයට ගිවිසුම්ගත වී නොතිබුණි. | පිළිතුරු ලැබී නොතිබුණි. | ගිවිසුම්ගත වී ආදායම් උපයාගත යුතු වීම. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේ සිට 2021 දක්වා කාලයක් පැරණි රු.365,161ක ණය ශේෂයක් නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය නොවී පැවතුණි. | මෙම ණය අය කිරීමට කටයුතු කරමින් පවතී. | ණය ශේෂ නොපමාව අයකර ගත යුතුවේ. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා ආදායමට ගත යුතු රු.134,138 ක් තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බව | ආදායම් නිසි ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | අයිතිය නිරවුල් නොවූ හා වපසරියක් නොදත් ඉඩමක වන වගාවක් කිරීමට මහා සභා තීරණයක් ගෙන තිබුණි. | සභාව සතු බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | වත්කම්වල අයිතිය නිරවුල් කරගත යුතු වේ. |